**<u>මධ්‍යම  පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ</u>**
**<u>බෝවත්ත බංගලාව වැඩිහිටි නිවාසය සඳහා අනුමත කළමණාකරණ සහකාර තාක්ෂණ නොවන බණ්ඩ 2</u>**
**<u>සේවා ගණයේ සාත්තු සේවිකා තනතුරේ III ශ්‍රේණිය සඳහා තෝරා ගැනීමට අදාල අයදුම්පත් කැඳවීම.(විවෘත)</u>**

මධ්‍යම  පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ බෝවත්ත බංගලාව වැඩිහිටි නිවාසය සඳහා  සාත්තු සේවිකා තනතුර සඳහා පත් කර ගැනීමට සුදුසුකම් ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2026. 10.02 වේ.

02.  මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2021.04.07 දිනැතිව අනුමත කරන ලද මධ්‍යම පළාත් සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ බෝවත්ත බංගලාව වැඩිහිටි නිවාසය සඳහා අනුමත කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ සාත්තු සේවිකා තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 7.2.2 හි විධිවිධාන අනුව 2026.01.27 දිනට වයස අවුරුදු 18 ත් 30 ත් අතර පහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයට මේ සඳහා අයදුම් කල හැකිය.

03. තනතුරු 02 ක් සඳහා අයදුම්පත් කැඳවන අතර මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 ට අනුව මෙම තනතුරට අදාල වැටුප් කේතය හා පරිමාණය පහත පරිදි වේ.
MN 01 – 2025, 45230 – 10 X 540 – 11 X 630 – 10 X 890 – 10 X 1190 – 78360.00

(i) අධ්‍යාපන සුදුසුකම් - සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් (02) දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් (06) හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත්ව තිබීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙල විභාගයේදී අවම වශයෙන් විෂයන් එකක් වත් (01)(සාමාන්‍ය පොදු පරික්ෂණය සහ සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සමත් වී තිබීම.

(ii) වෘත්තිය සුදුසුකම්- ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලය, තෘතියික හා වෘත්තීය කොමිෂන් සභාව පිළිගත් ආයතනයක් හෝ  විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයකින් නිකුත් කරනු ලබන ක්ෂේත්‍රයට අදාල එනම් සාත්තු සේවයට අදාල එක් අවුරුදු පාඨමාලාවක් හදාරා තිබීම.

(iii) පළපුරුද්ද - තනතුරට අදාල ක්ෂේත්‍රයේ පලපුරුද්ද විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

(iv) කායික සුදුසුකම් - සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරිරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(v) වෙනත් - i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න වසර 3 ක කාලය තුළ මධ්‍යම පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර  පදිංචිය ඇති පුරවැසියෙකු විය යුතුය.

iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් , එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

v.අයදුම් කල හැක්කේ කාන්තා අයදුම්කරුවන්ට පමණි.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

03. බඳවා ගැනීමේ ක්‍රමය - (i) මූලික සුදුසුකම් සම්පූර්ණ කරන අයදුම්කරුවන් සඳහා,

a. අභියෝග්‍යතා පරීක්ෂණය හා සාමාන්‍ය දැනීම
b. සාත්තු සේවය පිළිබඳ දැනුම

යන විෂයන්ගෙන් යුත් ලිඛිත විභාගයක් පවත්වනු ලැබේ. සමත්වීම සඳහා එක් විෂයකට අවම ලකුණු 40 ක් ලබාගත යුතුය.

(ii) ලිඛිත විභාගය සමත් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතුරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණයට කැඳවා ලිඛිත විභාගය හා වෘත්තීය පරීක්ෂණය යන දෙකේ ලකුණු එකතුවෙන් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතුරින් බඳවාගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුසුකම් පරීක්ෂාකර බඳවාගනු ලැබේ.

(iii) වෘත්තීය පරීක්ෂණය - තනතුරට අදාල ශිල්පීය කාර්යයන් ඉටුකිරීම පිළිබඳ හැකියාව පරීක්ෂා කිරීම සඳහා පැය 01 ක කාලයක් තුල රජයේ හෝ පෞද්ගලික වැඩිහිටි නිවාසයකදී ලබාදෙනු ලබන ප්‍රායෝගික ක්‍රියාකාරකමක් සඳහා විෂය භාර අමාත්‍යංශ ලේකම් හෝ ලේකම් විසින් බලය පවරන ලද ආයතනයක් හෝ පුද්ගලයෙක් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් ලකුණු ලබාදෙනු ලැබේ. සමත් ලකුණු 40 කි.

(iv) අයදුම්පත් කැඳවීමේ ක්‍රමය - දැන්වීමේ පල කර ඇති අයදුම්පතේ ආකෘතියට අනුව සකස් කරගත් අයදුම්පතක් සම්පූර්ණ කර 2026.10.02 දින හෝ එදිනට පෙර ලේකම්, තැ.පෙ 121, මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, සංඝරාජ මාවත මහනුවර ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමුකල යුතුය.අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ "බෝවත්ත බංගලාව වැඩිහිටි නිවාසය සඳහා අනුමත කළමණාකරණ සහකාර තාක්ෂණ නොවන බණ්ඩ 2 සේවා ගණයේ සාත්තු සේවිකා III ශ්‍රේණිය සඳහා තෝරා ගැනීමට අදාල අයදුම්පත් කැඳවීම" ලෙස සඳහන් කල යුතුය.

දිනය 2026.09.11

ජගත් අධිකාරි
ලේකම්
සෞඛ්‍ය දේශීය වෛද්‍ය සමාජ සුභසාධන
පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය
මධ්‍යම පළාත

Gazette.lk